
# සැළැස්මක් සම්පාදනය සඳහා දත්තයන් ලබා ගැනීම


**ව්‍යාපෘති 2**

පර්යේෂණ හා පුහුණු කිරීමේ නිලධාරි
**ඒ. එම්. ටී. ගුණවර්ධන විසිනි**

**කෘෂිකර්ම ව්‍යාපෘති වැඩපිළිවෙලක (කෘෂි කර්ම ව්‍යාප්ති ව්‍යාපෘතියක) වෙනත් ඕනෑම වැඩපිළිවෙලක මෙන් ප්‍රධාන අවස්ථා තුනක් ඇති බව අපේ මුල් ලිපියේ සඳහන් කළෙමු. මෙම අවස්ථා නම් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා අගය කිරීමයි. මේ අවස්ථාවල සම්බන්ධය පහත සඳහන් රූපසටහනෙහි දක්වා ඇත.**




කෘෂිකර්ම ව්‍යාප්ති වැඩපිළිවෙලක් සම්පාදනය කිරීමේදීත්, ක්‍රියාත්මක කිරීමේදීත්, අගය කිරීමේදීත් සාමාන්‍යයෙන් පිළිපදින පියවරවල් පසුගිය ලිපියේ සැකෙවින් දක්වා ඇත. එම පියවරවල් මෙම ලිපියේ හා ඉදිරි ලිපිවලදී සාකච්ඡා කරමු. ඔබේ පහසුව සඳහා එම පියවරවල් රූපසටහනක් මගින් පහත ඉදිරිපත් කර ඇත.




මුල් ලිපියේ සඳහන් අන්දමට ව්‍යාප්ති වැඩපිළිවෙලක සම්පාදනයේ පළමුවන අදියර තත්වය නිගමනයයි. තත්වය නිගමනය යට තේ පහත සඳහන් අවස්ථා සඳහන් කළෙමු.

(අ) ව්‍යාප්ති කටයුතු සඳහා මූලික අවශ්‍යතාවයන් නිගමනය කිරීම;

(ආ) අවශ්‍යතාවයන් විග්‍රහ කිරීම – අවශ්‍යතාවයන්හි වැදගත්කම නිගමනය කිරීම;

(ඇ) වැදගත් අවශ්‍යතාවයන් තෝරා ගැනීම.


මූලික අවශ්‍යතාවයන් නිගමනය කිරීම යනුවෙන් අදහස් කරන්නේ ඔබේ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශයේ මහජනතාවගේ (කෘෂිකාර්මික කටයුතු සම්බන්ධ නිසා ගොවි ජනතාවගේ) අවශ්‍යතාවයන් (ගොවි ජනතාව සම්බන්ධයෙන් නම් කෘෂිකාර්මික අවශ්‍යතාවයන්) නිගමනය කිරීමයි. අවශ්‍යතාවයන් නිගමනය කිරීම සඳහා අපට එම ප්‍රදේශය හා එහි ගොවි ජනතාව පිළිබඳව තොරතුරු (දත්තයන්) රැස් කිරීම අවශ්‍ය වේ. තොරතුරු රැස් කිරීම අපට ක්‍රම කිහිපයකින් කළ හැකි වේ.

(අ) විද්‍යාත්මක ක්‍රම අනුව සංවිධානය කරන ලද සමීක්ෂණයකින්;

(ආ) ප්‍රකාශන මගින් නිකුත් කර ඇති දත්තයන්;


(ඇ) විධිමත් නොවන ක්‍රම වලින් තොරතුරු ලබා ගැනීම – නොයෙකුත් පුද්ගලයන් හා සංවිධාන වැනි මාර්ග වලින් තොරතුරු ලබා ගැනීම මෙහිදී ක්‍රමවත්ව ඒවා එකතු කිරීමක් සිදු නොවේ.

සමීක්ෂණයකින් ලබා ගන්නා තොරතුරු බොහෝදුරට නිවැරදිය. එහෙත් එසේ තොරතුරු ලබා ගැනීමට වැය වන ශ්‍රමය, කාලය හා වියදම බොහෝ වේ. විධිමත් නොවන ක්‍රම මගින් ලබා ගන්නා තොරතුරුවල නිවැරදිතාවය සැක සහිත වුවත්, පහසුවෙනුත් ලාභයටත් ලබා ගත හැකි වේ.





(අ) සමීක්ෂණයක් මගින් තොරතුරු එකතු කර ගැනීම:

සමීක්ෂණයකින් අප කරන්නේ නියැදියක් **(Sample)** තෝරාගෙන, එම නියැදිය පිළිබඳව තොරතුරු රැස් කරගෙන එමගින් ජනගහණය **(Population)** පිළිබඳව යම් නිගමනයන්ට එළඹීමයි. ජනගහණය බොහෝවිට සාමාජිකයන් විශාල ප්‍රමාණයකින් යුක්ත බැවින් එයට ඇතුළත් වන සාමාජිකයින් සියල්ලම පිළිබඳව විස්තර ලබා ගත නොහැකිය. මෙනිසා අප නියැදියක් පමණක් තෝරාගෙන එම නියැදියට ඇතුළත් වන සාමාජිකයින් පිළිබඳව විස්තර ලබාගෙන එමගින් ජනගහණය පිළිබඳව යම් නිගමනයන්ට එළඹෙනු ලැබේ.




ජනගහණයෙහි එක් එක් ආකාරයේ ඒකක (සාමාජිකයින්) ඇතුළත් වන බැවින් ඒ ඒ වර්ගයේ ඒකකයන් නියැදියටද ඇතුළත් විය යුතුය. වෙනත් වචනයකින් කිවහොත් නියැදිය බොහෝදුරට (ප්‍රමාණයෙන් හැර) ජනගහණයට සමාන විය යුතුය. එසේ සමාන වූ විට පමණය, නියැදිය ආධාර කර ගෙන ජනගහණය පිළිබඳ නිගමනයන්ට එළඹිය හැක්කේ.




ජනගහණයට සමානාත්මතාවයක් පෙන්නුම් කරන ආකාරයේ නියැදියන් තෝරා ගනු පිණිස සංඛ්‍යාලේඛන ක්‍රම භාවිතා කරනු ලැබේ. පහසුම ක්‍රමය නම් ජනගහණයේ සෑම සාමාජිකයෙකුගේම ලැයිස්තුවක් ලබාගෙන එම ලැයිස්තුවේ එක් ස්ථානයකින් පටන් ගෙන සෑම එක් පොදු අන්තරයක් ඇතිව සාමාජිකයින් තෝරා ගැනීමයි. මෙම ක්‍රමය මගින් නියැදියක් තේරීමේදී සෑම ඒකකයටම තෝරා ගැනීමට එක් සමාන අවස්ථාවක් ලැබේ. එහෙත් සාමාජික ලැයිස්තුව යම් ක්‍රමයක් අනුව සකස් කර තිබේ නම් නියැදියෙහි ජනගහණයට ඇති සමානාත්මතාවය වෙනස් විය හැක.

මෙහි පහත දක්වෙන්නේ සාමාජිකයින්ගේ ලැයිස්තුවක් යයි සිතමු. එහි 7 ක අන්තරයක් ඇතිව 3, 10, 17, 24, ...... යන සාමාජිකයින් තෝරාගෙන ඇත.

| | | | | |
|---|---|---|---|---|
| 1 | 11 | 21 | **31** | 41 |
| 2 | 12 | 22 | 32 | 42 |
| **3** | 13 | 23 | 33 | 43 |
| 4 | **14** | **24** | 34 | 44 |
| 5 | 15 | 25 | 35 | **45** |
| 6 | 16 | 26 | 36 | 46 |
| **7** | **17** | 27 | 37 | 47 |
| 8 | 18 | 28 | **38** | 48 |
| 9 | 19 | 29 | 39 | 49 |
| **10** | 20 | 30 | 40 | 50 |

නියැදියට ඇතුළත් වන්නේ මෙසේ තෝරා ගත් සාමාජිකයින් පමණි. නියැදිය විශාල නම් ලබා ගන්නා දත්තයන්හි වැඩි නිවැරදි තාවයක් බලාපොරොත්තු විය හැක.

නියැදිය තෝරා ගැනීමෙන් පසුව කළ යුත්තේ විස්තර ලබා ගැනීමයි. සමීක්ෂණ වලදී බොහෝවිට මේ සඳහා ප්‍රශ්නමාලාවක් භාවිතා කරනු ලබන අතර උත්තරද එහිම සඳහන් කර ගනු ලබයි. විශේෂයෙන්ම සංඛ්‍යාලේඛන ලබා ගන්නාවිට (උදා: අස් වැන්න, යොදා ගන්නා පොහොර ප්‍රමාණය වැනි) ප්‍රශ්නමාලාවක් භාවිතා කළයුතු වේ. වී ගොවිතැන සම්බන්ධ විස්තර ලබා ගැනීම සඳහා සකස් කරන ලද සරල ප්‍රශ්නමාලා වක් පහතින් දක්වේ.

## වී ගොවිතැන සම්බන්ධ සමීක්ෂණය - ප්‍රශ්න මාලාව

**1. සාමාන්‍ය තොරතුරු**

1.1 ගොවි මහතා ගේ නම

1.2 කුඹුරේ ප්‍රමාණය

1.3 ජල සැපයුම (ප්‍රධාන වාරිමාර්ග/සුළු වාරිමාර්ග/වැසි ජලයෙන් පෝෂිත වැනි)

1.4 ඉඩම් අයිතිය (තනි අයිතිය/හවුල් අයිතිය/අඳ වැනි);

1.5 වගා කරන මුළු ඉඩම් ප්‍රමාණය – ගොඩ ඉඩම්, මඩ ඉඩම්

**2. වගා කරන වී වර්ග හා වගා කරන ප්‍රමාණ**

| වර්ගය | මහ කන්නය (අක්කර) | යල කන්නය (අක්කර) |
|---|---|---|
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |
| ............ | ............ | ............ |

**3. බෝග සම්පාදන ක්‍රම හා එක් එක් සම් පාදන ක්‍රම යටතේ වගා කරන ප්‍රමාණය:**

| සම්පාදන ක්‍රම | මහ (අක්කර) | යල (අක්කර) |
|---|---|---|
| පැල සිටවීම (පේළියට) | ............ | ............ |
| පැල සිටවීම (අහඹු ලෙස) | ............ | ............ |
| වැපිරීම | ............ | ............ |
| ............ | ............ | |
| ............ | ............ | |

**4. පොහොර භාවිතය:**

| යෙදූ පොහොර වර්ගය | යෙදූ පොහොර ප්‍රමාණය (හොන්ඩර) |
|---|---|
| ............ | ............ |
| ............ | ............ |

| පොහොර යෙදූ බිම් ප්‍රමාණය (අක්කර) | පොහොර යෙදූ කාලසීමාව (සති) |
|---|---|
| ............ | ............ |
| ............ | ............ |

**5. පළිබෝධක (කෘමි) මර්ධනය:**

| පළිබෝධකයා/ කෘමියා | උවදුරේ ප්‍රමාණය (අධික/සුළු) |
|---|---|
| ............ | ............ |
| ............ | ............ |
| ............ | ............ |

| මර්ධන ක්‍රම යෙදුවේ නම් යෙදූ ක්‍රමය (හෝ කෘමිනාශකය) | මර්ධනයේ තත්වය (හොඳයි/ සතුටුදායකයි/) අසතුටුදායකයි) |
|---|---|
| ............ | ............ |
| ............ | ............ |

සමීක්ෂණයක් මගින් ලබා ගත් විස්තර (දත්තයන්) විශ්ලේෂණය (විග්‍රහය) සහ අර්ථ නිරූපනය පිළිබඳව සාකච්ඡා කිරීමට බලාපොරොත්තු නොවෙමි. සංඛ්‍යාලේඛන ඇතිව දත්තයන් එකතු කර ඇත්නම් දත්ත විශ්ලේෂණය ඉතාම වැදගත් වේ. මෙවැනි දත්තයන්ගේ එකතුව, සාමාන්‍ය, ප්‍රතිශතය, මාධ්‍ය වැනි සංඛ්‍යාලේඛන ගණනය දත්ත විශ්ලේෂණයේදී සාමාන්‍යයෙන් අනුගමනය කරන ක්‍රමයි. නියැදිය පිළිබඳව ගැනෙන නිගමනයන් ජනගහණයට උපකල්පනය කළ හැක.

(ආ) ප්‍රකාශන මගින් නිකුත් කර ඇති දත්තයන්:

රජයේ දෙපාර්තමේන්තු හා ආයතන (සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව වැනි) මගින් නොයෙක් දත්තයන් සහිත ප්‍රකාශන නිකුත් කර ඇත. ඔබගේ ව්‍යාපෘති වැඩ කටයුතු කිරීමට බලාපොරොත්තු වන ප්‍රදේශය පිළිබඳව විස්තර මේ ප්‍රකාශන මගින් ලබාගත හැකි නම් එම විස්තර සැළැස්ම සම්පාදනය සඳහා යොදු ගත හැක.

(ඇ) විධිමත් නොවන ක්‍රම වලින් විස්තර ලබා ගැනීම:

''සමීක්ෂණයක් මගින් විස්තර ලබා ගැනීම පිළිබඳව අප මුලින් සාකච්ඡා කළෙමු. අවශ්‍ය විස්තර ලබා ගැනීමට ඇති පහසු ක්‍රමයක් නම් එම විස්තර ඒ පිළිබඳව දැනුමක් ඇති පුද්ගලයන්ගෙන් හෝ ආයතන වලින් ලබා ගැනීමයි. උදහරණයක් වශයෙන් ඔබට අවශ්‍යවන්නේ කෘෂිකර්මයට සම්බන්ධ විස් තර නම් (පොහොර භාවිතය, බෝග වර්ග භාවිතය වැනි) කෘෂිකර්ම ව්‍යාප්ති කාර්ය මණ්ඩලය වැනි කෘෂිකර්මයට සම්බන්ධ කටයුතුවල යෙදෙන රජයේ නිලධාරීන්, වෙනත් පරිපාලන කටයුතුවල යෙදෙන නිලධාරීන්, සහ හොඳින් ගොවිතැන් කටයුතුවල යෙදෙන ගොවි මහතුන් වැනි අයගෙන් ඒවා ලබා ගත හැක. එහෙත් සංඛ්‍යාලේඛන අවශ්‍ය නම් මෙම ක්‍රමය එතරම් සුදුසු නොවේ. බොහෝවිට තොරතුරු ලබා ගැනීම සඳහා මාර්ග එකකට වැඩි ගණනක් අනුගමනය කරනු ලැබේ. අවශ්‍ය තොරතුරු (දත්තයන්) අනුවත්, තොර තුරුවල අවශ්‍ය වන නිවැරදිතාවය අනුවත් විස්තර ලබාගැනීමේ ක්‍රම තෝරා ගත හැකිවේ.